# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date. 2026.07.07

ඩබ්.එම්.එස්.කරුණාරත්න
අංක 169, මහමීගස්සෑගම,
මහඉලුප්පල්ලම.

**පැමිණිලිකාර පාර්ශවය**

1) කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
තැ.පෙ. අංක 01, පේරාදෙණිය.

2) ප්‍රධාන විධායක නිලධාරී
ජාතික රක්ෂණ භාර අරමුදල
අංක 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර්මාවත
කොළඹ 02.

**වගඋත්තරකාර පාර්ශවය**

**පැමිණිලි අංකය: HRC/ANU/294/2024 (T)**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

පැමිණිලිකාර ඩබ්.එම්.එස්.කරුණාරත්න යන අය විසින් 2024.06.28 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කරමින් ප්‍රකාශ කර සිටින්නේ, තමා මහඉලුප්පල්ලම බීජ පරීක්ෂණාගාරයේ මුරකරු ලෙස සේවය කරන බවත්, තමාගේ පාදයේ තුවාලයක් හටගැනීම හේතුවෙන් 2023.10.26 දින සිට 2023.11.13 දක්වා අනුරාධපුර ශික්ෂණ රෝහලේ ද, 2023.11.14 දින සිට 2023.12.01 දින දක්වා නෑගම්පහ ග්‍රාමීය රෝහලේ ද නේවාසිකව ප්‍රතිකාර ලබා ගත් බවත් ය. එසේම, තමා අග්‍රහාර රන් රක්ෂණ ක්‍රමයට දායක වී ඇති බවත්, තමා රෝහල්ගතව සිටි කාලය සඳහා අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් දෙකක් 2023.12.29 වන දින ලියාපදිංචි තැපැල් මගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ අග්‍රහාර ශාඛාව වෙත යොමු කරන ලද බවත්, එකී අයදුම්පත් 2024.01.05 දින අදාළ ශාඛාව වෙත ලැබී ඇති බවත්, ඒ අනුව තමා රෝහලෙන් පිටවූ දින සිට දින 90ක් ගත වීමට පෙර තම අයදුම්පත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ අග්‍රහාර ශාඛාව වෙත යොමු කරන ලද බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

පැමිණිලිකරු වැඩිදුරටත් තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ, තමා නිශ්චිත කාල සීමාවන් තුළ තම අග්‍රහාර ප්‍රතිපූර්ණ අයදුම්පත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත යවා ඇති නමුත්, තමාට හිමි අග්‍රහාර රක්ෂණ මුදල් ලැබී නොමැති බවත්, මෙලෙස මුදල් නොලැබීමට හේතුව වී ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත තම අයදුම්පත් නියමිත දිනට පෙර යවා නොමැති බව නිසාවෙන් බවත්, මේ නිසා තමාට අසාධාරණයක් සිදුව ඇති බවත් ය.

__1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ කරුණු දැක්වීම__

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක කෘ.දෙ./පා/1/7/13 සහ 2024.07.30 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත යොමු කරමින් ප්‍රකාශ කර සිටින්නේ, පැමිණිලිකරු 2023.10.26 දින සිට 2023.11.13 වන දින දක්වා රෝහල් ගත වීමට අදාළව අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා යොමු කරන ලද අයදුම්පත 2024.01.05 දින කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අග්‍රහාර ශාඛාව වෙත ලැබී ඇති බවත්, අයදුම්පත යොමු කිරීමේ දී ලබාදී ඇති උපදෙස් පරිදි අයදුම්පත ඉදිරිපත් කිරීමට පූර්වාසන්න මාස තුනක වැටුප් විස්තර ඉදිරිපත් කළ යුතු වුවද පැමිණිලිකරු නියමිත වැටුප් වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් 2023 ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් යන මාස වලට අදාළ වැටුප් විස්තර ලබා ගැනීම සඳහා 2024.01.17 දිනැතිව කාර්යාල මැමෝ පත්‍රයක් වැටුප් කළමනාකරණ ශාඛාව වෙත යොමු කරන ලද බවත්, අදාළ වැටුප් වාර්තා ගෙන්වා ගැනීමෙන් අනතුරුව අදාළ අයදුම්පත සහ අදාළ ලේඛන 2024.02.14 දිනැති ලිපිය මගින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කරන ලද බවත් ය.

එසේම, අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කිරීමට අදාළ දින 90ක කාලසීමාව ඉක්මවා යාම හේතුවෙන් පැමිණිලිකරුගේ අයදුම්පත ප්‍රතික්ෂේප වී ඇති බවට තොරතුරු ලද බවත්, ඒ අනුව පැමිණිලිකරු විසින් 2024.04.08 දින අභියාචනයක් යොමු කර ඇති බවත්, අයදුම්පත යොමු කිරීමේදී සිදු වූ ප්‍රමාද වීම රක්ෂිතයාගේ (පැමිණිලිකරුගේ) වරදින් සිදු වූ ප්‍රමාද දෝෂයක් නොවන බැවින් ඔහුගේ ඉල්ලීම පිළිබඳව සානුකම්පිතව සලකා බලා ගෙවීම් කටයුතු සිදුකරන ලෙසට ජාතික රක්ෂණ භාර අරමුදල වෙත අංක කෘ.දෙ./පා/6/6/GEN/2024/04 සහ 2024.04.19 දිනැති ලිපියක් යොමු කර ඇති බවත් 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සිය වාර්තාව මගින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

තවද, පැමිණිලිකරුගේ දෙවන අයදුම්පත අනුව මෙම පැමිණිලිකරු 2023.11.14 දින සිට 2023.12.02 දින දක්වා රෝහල් ගත වීමට අදාළ අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා යොමු කරන ලද අග්‍රහාර අයදුම් පත 2024.01.05 වන දින කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අග්‍රහාර ශාඛාව වෙත ලැබී ඇති බවත්, තමා එම අයදුම්පත අංක කෘ.දෙ./පා/6/6/HC/2024/02/16 2024.02.22 දිනැති ලිපිය මගින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කරන ලද බවත්, මෙම අයදුම්පතට අදාළ රක්ෂණ ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කිරීමේ කාලසීමාව ඉක්මවා ඇති බව දක්වමින් ජාතික රක්ෂණ භාර

අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරිගේ අංක NITF/24/16995/ACHINIP සහ 2024.03.20 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බවත් 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සිය වාර්තාව මගින් දක්වා ඇත. එසේම, එම අයදුම්පත 2024.02.22 දින තම දෙපාර්තමේන්තුව විසින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කර ඇති බැවින් මෙම අයදුම්පතට අදාළ ගෙවීම් කිරීමට කටයුතු කරන ලෙස අංක කෘ.දෙ./පා/6/6/GEN/2024/04 සහ 2024.04.19 දිනැති ලිපිය මගින් ඉල්ලීමක් ද සිදු කර ඇති බවත් 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සිය වාර්තාව මගින් තවදුරටත් සඳහන් කර ඇත.

එසේම, මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක කෘ.දෙ./පා/6/1/20 සහ 2025.07.15 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත යොමු කරමින් ප්‍රකාශ කර සිටින්නේ, තමා විසින් 2024.04.19 දිනැතිව ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කරන ලද ලිපියට කිසිදු ප්‍රතිචාරයක් නොමැති වීම හේතුවෙන්, 2025.01.09 දින නැවත වරක් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ලිපියක් යොමු කරමින්, නියමිත කාල සීමාව තුළ තැපැලට යොමු කර ඇතත් තැපැල් ප්‍රමාදය හේතුවෙන් රක්ෂණ භාර අරමුදල වෙත ලැබීමේ දී දින 90 ඉක්මවා ඇති බැවින් ගෙවීම් ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් සම්බන්ධයෙන් නැවත සලකා බලන ලෙස ඉල්ලීම් කරන ලද බවයි.

එසේම ඉහත ඉල්ලීම් වලටද කිසිදු ප්‍රතිචාරයක් නොමැති බැවින් රාජ්‍ය පරිපාලන, පලාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙතද මෙම ගැටළුව පිළිබඳව දන්වා අදාළ ගෙවීම් කිරීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල වෙත අවශ්‍ය උපදෙස් ලබාදෙන ලෙස ඉල්ලමින් 2025.04.07 දින ලිපියක් ඉදිරිපත් කරන ලද බවත්, ඒ සඳහා මේ දක්වා පිළිතුරක් නොලැබීම මත, 2025.07.07 දින සිහිකැඳවීම් ලිපියක් යවා ඇති බවත් 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිය වාර්තව මගින් දක්වා ඇත.

තවද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් සේවක සංඛ්‍යාව 9217කට අධික වන බවත්, පැමිණිලිකරුගේ අයදුම්පත් ඉදිරිපත් වූ කාල සීමාව තුළ පැවති ඒකාබද්ධ සේවයේ සේවක හිඟය හේතුවෙන් මෙම සියළු නිලධාරීන්ගේ අග්‍රහාර අයදුම්පත් සම්බන්ධයෙන් එවකට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ සම්බන්ධීකරණ කටයුතු කළේ නිලධාරීන් දෙදෙනෙකු පමණක් බවත්, සිදු වූ ප්‍රමාදයන් සම්බන්ධයෙන් මෙම අයදුම්පත් වලට අදාළව කටයුතු කළ නිලධාරිනිය වෙත මූලික විමර්ශනයක්ද සිදුකර එම නිලධාරිනියට ස්ථාන මාරුවීමක් ද මේ වන විට ලබා දී ඇති බවත් 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිය වාර්තව මගින් දක්වා ඇත. එසේම, මෙම පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත් දෙකෙන් එක් අයදුම්පතක් දින 90 සම්පූර්ණ වී එක් දිනකට පසුව ද, අනෙක් අයදුම්පත දින 90 ඉක්මවීමට පෙර ද ජාතික රක්ෂණ භාර අරමුදල වෙත තැපැල මගින් ඉදිරිපත් කර ඇති බවත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 II න් සංශෝධිත 12/2005 චක්‍රලේඛයේ 07.1 වගන්තිය අනුව අදාළ අයදුම්පත් දින 90ක් ඇතුළත ශ්‍රී ලංකා

රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු බව සඳහන්ව ඇති අතර ඒ අනුව නියමිත දින 90 ඇතුලත මෙම අයදුම්පත් තැපැලට යොමු කර ඇති බව තහවුරු වන බවත්, තැපැල් බෙදා හැරීමේ ක්‍රියාවලිය තුළ සිදුව ඇති යම් ප්‍රමාදයක් හේතුවෙන් මෙම අයදුම්පත් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ලැබීමේ දී දින 90 ඉක්මවා ඇති බව නිරීක්ෂණය වන බැවින් ඒ සඳහා සුදුසු කටයුතු සිදු කර අදාළ ගෙවීම් රක්ෂිතයා (පැමිණිලිකරු) වෙත ලබා දීමට අවශ්‍ය මැදිහත්වීම සිදුකර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටින බවත් 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිය වාර්තව මගින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

<u>2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරීගේ කරුණු දැක්වීම</u>

මෙම පැමිණිල්ලට අදාළව අංක NITF/CLM/AGRA/COM/2024 සහ 2024.10.03 දිනැති වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී ප්‍රකාශ කර සිටින්නේ, මෙම පැමිණිලිකරුට අදාළව රක්ෂණ හිමිකම් අයදුම්පත් දෙකක් අංක 16227 හා 16995 ලෙස තමා වෙත එවා තිබූ බවත්, මෙම අයදුම්පත් වල කාල සීමාවන් සලකා බැලීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 (II) හි 07 පරිදි දින 90ක කාල සීමාව ඉක්මවා යාමෙන් පසු අදාළ අයදුම්පත් දෙක කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති බවත්, ඒ අනුව නියමිත දින සීමාව අවසන් වීමෙන් පසු මෙම අයදුම්පත් ඉදිරිපත් කර ඇති බැවින් අදාළ හිමිකම් ලබා ගැනීමට හැකියාවක් නොමැති බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇති බවත් ය.

එසේම, අංක NITF/CLM/AGRA/COM/2024 සහ 2025.05.20 දිනැති වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 (II) ප්‍රකාරව අදාළ සියලුම වෛද්‍ය ගාස්තු සහ රෝහල් බිල්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් රෝහලෙන් බැහැර වී දින 90ක් ඇතුළත ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කළ යුතු බවත්, ශ්‍රී ලංකාවේ සියලුම රාජ්‍ය ආයතන සඳහා එකම නීතිමය රාමුවක සිට ක්‍රියා කළ යුතු බැවින් ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ12/2005 ප්‍රකාරව කටයුතු කළ යුතු බැවින් ද නියමිත කාල සීමාවෙන් පසුව ලැබුණු මෙම අයදුම්පත් සම්බන්ධයෙන් සලකා බැලීමට හැකියාවක් නොමැති බවත්, මෙවැනි අවස්ථා අවම කරගැනීමටත් කාර්යක්ෂම සේවාවක් සැපයීමටත් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත අයදුම්පත් රැගෙනවිත් භාරදීමට (තැපැල් ප්‍රමාදයන්/අතරමඟ ප්‍රමාදයන් වළක්වා ගැනිමට) විශේෂ වැඩපිළිවෙළක් සකස් කර ඇති බවත් ය.

<u>නිරීක්ෂණ</u>

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ, තමා 2017 වසරේ සිට අග්‍රහාර රන් ගිණුමට සාමාජික මුදල් අඛණ්ඩව බැර කළ බවත්, තම අසනීප තත්ත්වයන් හේතුවෙන් රෝහල්ගතව

ප්‍රතිකාර ලබා ගැනීමෙන් පසු අදාළ අග්‍රහාර රක්ෂණ මුදල් ඉල්ලා අයදුම්පත් ඉදිරිපත් කළද තම අයදුම්පත් ප්‍රතික්ෂේප වීමෙන් තමාට අසාධාරණයක් සිදුව ඇති බවත් ය.

2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී ප්‍රකාශ කර සිටින්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/2005(II) ප්‍රකාරව නියමිත කාල සීමාව තුළ පැමිණිලිකරුගේ අයදුම්පත් තමා වෙත නොලැබීමෙන් ප්‍රතිලාභ ලබා දීම ප්‍රතික්ෂේප කර ඇති බවයි.

මෙම පැමිණිලිකරු අසනීප තත්වයක් හේතුවෙන් 2023.10.26 සිට 2023.11.13 දින දක්වා අනුරාධපුර ශික්ෂණ රෝහලෙහි නේවාසිකව ප්‍රතිකාර ලබා ඇති අතර, එම කාලය සඳහා වන අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා වන 2023.12.04 දිනැති අග්‍රහාර අයදුම්පත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත 2024.01.05 දින ලැබී ඇති බව 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පිළිගෙන ඇත. එසේම, පැමිණිලිකරුගේ අයදුම්පත සමඟ 2023 ජූලි, අගෝස්තු, සැප්තැම්බර් යන මාසවල වැටුප් විස්තර ඉදිරිපත් කර නොතිබූ බැවින් වැටුප් විස්තර ලබා ගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී (වැටුප් 11) වෙත 2024.01.17 දින ශාඛා ප්‍රධානි (පාලන 06 ශාඛාව) විසින් කාර්යාල මැමෝ පත්‍රයක් යොමු කර ඇති බව නිරීක්ෂණය වේ. මෙම වැටුප් විස්තරය ලබා ගැනීමෙන් අනතුරුව පැමිණිලිකරු 2023.10.26 සිට 2023.11.13 දින දක්වා රෝහල්ගතව ප්‍රතිකාර ලැබීමට අදාළ අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා වන අයදුම්පත, 1 වන වගඋත්තරකරු විසින් 2024.02.14 දිනැති ලිපිය මගින් 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත ලියාපදිංචි තැපැල් මගින් 2024.02.15 දින යවා ඇති බව නිරීක්ෂණය වේ. එසේම, මෙම අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කිරීම සඳහා වූ අයදුම්පත දින 90ක කාල සීමාව ඉක්මවීමෙන් පසුව යොමු කර ඇති බැවින් එය ප්‍රතික්ෂේප කරන බව දන්වා 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී විසින් 2024.03.26 දිනැති ලිපිය පැමිණිලිකරු වෙත එවා ඇති බව ද නිරීක්ෂණය වේ.

අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීමට අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(II) හි 07.I. වගන්තිය ප්‍රකාරව අදාළ රක්ෂණ මුදල් ලබාගැනීමට නම් සියලුම අදාළ වෛද්‍ය ගාස්තු හා රෝහල් බිල්පත් ප්‍රතිලාභ ඉල්ලුම්පතට අමුණා දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් දින 90ක් ඇතුළත සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙම ප්‍රතිපාදනය ප්‍රකාරව අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් මගින් පැමිණිලිකරුගේ අයදුම්පත ඔහු රෝහලෙන් බැහැර වූ දින සිට දින 90ක් තුළ 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත ඉදිරිපත් කර තිබිය යුතු ය.

පැමිණිලිකරු 2023.10.26 දින සිට 2023.11.13 දින දක්වා රෝහල්ගතව සිටි කාලය සඳහා වන අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා වන අයදුම්පත 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත ලැබී ඇත්තේ 2024.02.28 වන දින බවත්,

මෙම අයදුම්පත 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් තැපැල් කර ඇත්තේ 2024.02.15 වන දින බවත් ඉදිරිපත්ව ඇති ලේඛන අනුව නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලිකරු රෝහලෙන් බැහැර වූ දිනය වන 2023.11.13 දින සිට දින 90ක කාලසීමාව 2024.02.13 දිනට සම්පූර්ණ වන බවත්, 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පැමිණිලිකරුගේ අයදුම්පත 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත තැපැල් කර ඇත්තේ ද නියමිත දිනය වන 2024.02.13 දිනයේ සිට දින දෙකකට පසුව 2024.02.15 වන දින බවත්, පැමිණිලිකරුගේ අයදුම්පත 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත ලැබී ඇත්තේ 2024.02.28 දින වන බැවින්, අදාළ අයදුම්පත නියමිත දිනය වන 2024.02.13 දින වන විට 2 වගඋත්තරකරු වෙත ලැබී නොමැති බවත්, එකී අයදුම්පත 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත ලැබී ඇත්තේ පැමිණිලිකරු රෝහලෙන් බැහැර වූ දින සිට දින 105 ක් ගත වූ පසුව බවත් නිරීක්ෂණය වේ.

මෙලෙස ප්‍රමාද වී අදාළ අයදුම්පත ලැබීම හේතුවෙන් 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී විසින් පැමිණිලිකරුට අදාළ අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ලබා දීමට හැකියාවක් නොමැති බවට 2024.03.26 දිනැති ලිපිය මගින් පැමිණිලිකරු වෙත දැනුම් දීම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 (II) ප්‍රකාරව නීත්‍යානුකූල බව නිරීක්ෂණය වේ. කෙසේවෙතත් මෙලෙස පැමිණිලිකරුගේ අයදුම්පත නියමිත කාල සීමාව තුළදී 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත නොලැබීම පැමිණිලිකරුගේ දෝෂයකින් සිදු වූවක් නොවන බවත්, එය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රමාද දෝෂයක් හේතුවෙන් සිදු වූවක් බැවින් පැමිණිලිකරුට හිමි රක්ෂණ මුදල් ගෙවන ලෙසට 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙතින් අංක කෘ.දෙ./පා/6/6/GEN/2024/04 සහ 2024.04.19 දිනැති ලිපිය මගින් ඉල්ලීමක් කර ඇති බව ද නිරීක්ෂණය වේ. එහෙත් එකී ලිපිය සඳහා පිළිතුරක් නොලැබුණු බව 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් සඳහන් කර ඇත.

එසේම, පැමිණිලිකරුගේ අසනීප තත්ත්වය හේතුවෙන් නැවත 2023.11.14 දින සිට 2023.12.01 දින දක්වා නෑගම්පහ දිස්ත්‍රික් රෝහලෙහි නේවාසිකව ප්‍රතිකාර ලබා ඇති අතර, ඊට අදාළව අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා පැමිණිලිකරු විසින් යොමු කරන ලද අයදුම්පත 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත 2024.01.05 වන දින ලැබී ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් 2024.02.22 වන දිනැති ලිපිය මගින් 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන

විධායක නිලධාරී වෙත අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ වියදම් ප්‍රතිපූර්ණය කිරීම මැයෙන් අදාළ තොරතුරු යොමු කර ඇත. එහෙත් එකී ලිපිය තැපැල් කොට ඇත්තේ 2024.03.04 වන දින බව ඉදිරිපත්ව ඇති ලේඛන අනුව නිරීක්ෂණය වේ. ඒ අනුව 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී විසින් අදාළ අයදුම්පත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 (II)හි සඳහන් පරිදි නියමිත දිනට ඉදිරිපත් නොවූ බවත්, මෙම අයදුම්පත දින 90ක් පසු වී ලැබුණු බවත්, එසේ හෙයින් ගෙවීම් සිදු කළ නොහැකි බවත් දන්වා පැමිණිලිකරුට 2024.03.28 දිනැති ලිපිය යවා ඇත.

ඒ අනුව මෙම අයදුම්පතට අදාළව 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත 2024.04.19 වන දින ලිපියක් යවා ඇති බව නිරීක්ෂණය වන අතර, එමගින් දන්වා ඇත්තේ පැමිණිලිකරු 2023.11.14 දින සිට 2023.12.01 දින දක්වා රෝහල්ගතව ප්‍රතිකාර ලැබීමට අදාළ අයදුම්පත 2024.02.22 දින එවා ඇති බවත්, පැමිණිලිකරු රෝහලින් බැහැර වූ 2023.12.02 දින සිට දින 90ක් සම්පූර්ණ වන්නේ 2024.03.02 දිනට වන බවත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් දින 90 අනුව සම්පූර්ණ වීමට ප්‍රථම අයදුම්පත ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යවා ඇති බැවින් අදාල ගෙවීම් සිදුකරන ලෙසත් ය.

එහෙත් 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් 2024.02.22 දිනැති ලිපිය තැපැල් කොට ඇත්තේ 2024.03.04 වන දින බව ඉදිරිපත්ව ඇති ලේඛන අනුව නිරීක්ෂණය වන බැවින් ලිපිය තැපැල් කරන දිනය වන විට පැමිණිලිකරු රෝහලින් බැහැර වූ 2023.12.02 දින සිට දින 90ක් සම්පූර්ණ වන 2024.03.02 දිනය පසු වී දින දෙකක් ගත වී ඇති බවද නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලිකරු 2023.11.14 දින සිට 2023.12.01 දින දක්වා රෝහල්ගතව ප්‍රතිකාර ලැබීමට අදාළ අග්‍රහාර අයදුම්පත දින 90ක කාල සීමාව ඉක්මවා යාමට ප්‍රථම 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත යැවීමට 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් අපොහොසත් වී ඇති බව ද නිරීක්ෂණය වේ.

අනතුරුව 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක කෘ.දෙ./පා/6/6/GEN/2024/04 සහ 2024.05.31 දිනැති ලිපිය, 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත යොමු කරමින් පැමිණිලිකරු රෝහල්ගත වීමට අදාළව අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ප්‍රතිපූරණය කිරීම සඳහා යොමු කර ඇති අයදුම්පත් නියමිත දින 90ක කාලසීමාවෙන් පසුව ඉදිරිපත්ව ඇති බවට දන්වා ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් පැමිණිලිකරු අපහසුතාවයට පත්ව ඇති බවත්, එය පැමිණිලිකරුගේ ප්‍රමාදයක් හේතුවෙන් සිදුවූවක් නොවන බැවින් ඒ සඳහා කාරුණික අවධානය යොමු කර අදාළ ගෙවීම් සිදු කරන ලෙසට ඉල්ලා ඇති බවත් නිරීක්ෂණය වේ. කෙසේවෙතත් අදාළ අයදුම්පත් ප්‍රමාද වී ලැබී තිබීම හේතුවෙන් 2 වන

වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී විසින් පැමිණිලිකරු වෙත අදාළ ප්‍රතිලාභ ගෙවීම ප්‍රතික්ෂේප කර ඇත.

ඉදිරිපත්ව ඇති සියලුම කරුණු අනුව මෙම පැමිණිලිකරු විසින් ඔහු 2023.10.26 වන දින සිට 2023.11.13 දින දක්වා රෝහල්ගතව සිටි කාලය සඳහා වන අග්‍රහාර ප්‍රතිලාභ අයදුම්පත සහ 2023.11.14 දින සිට 2023.12.02 දින දක්වා රෝහල්ගතව සිටි කාලය සඳහා වන අග්‍රහාර ප්‍රතිලාභ අයදුම්පත 2024.01.05 වන දින කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලිකරුගේ පළමු අයදුම්පත රෝහලෙන් බැහැර වූ දිනය වන 2023.11.13 වන දින සිට දින 53ක් ඇතුළත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති බවත්, දෙවන අයදුම්පත රෝහලෙන් බැහැර වූ දිනය වන 2023.12.02 වන දින සිට දින 34ක් ඇතුළත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති බවත් නිරීක්ෂණය වේ. ඒ අනුව රෝහලෙන් බැහැර වූ දින සිට දින 90ක කාලයක් තුළ පැමිණිලිකරුගේ පළමු අයදුම්පත ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යැවීම සඳහා දින 37ක කාලයක් ද, දෙවන අයදුම්පත ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යැවීම සඳහා දින 56ක කාලයක් ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත තිබූ බව නිරීක්ෂණය වේ.

1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක කෘ.දෙ./පා/1/7/13 සහ 2024.07.30 දිනැති වාර්තාව මගින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු 2023.10.26 දින සිට 2023.11.13 වන දින දක්වා රෝහල් ගත වීමට අදාළව අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා යොමු කරන ලද අයදුම්පත 2024.01.05 දින කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අග්‍රහාර ශාඛාව වෙත ලැබී ඇති බවත්, අයදුම්පත යොමු කිරීමේ දී ලබාදී ඇති උපදෙස් පරිදි අයදුම්පත ඉදිරිපත් කිරීමට පූර්වාසන්න මාස තුනක වැටුප් විස්තර ඉදිරිපත් කළ යුතු වුවද පැමිණිලිකරු නියමිත වැටුප් වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් 2023 ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් යන මාස වලට අදාළ වැටුප් විස්තර ලබා ගැනීම සඳහා 2024.01.17 දිනැතිව කාර්යාල මැමෝ පත්‍රයක් වැටුප් කළමනාකරණ ශාඛාව වෙත යොමු කරන ලද බවත් ය. එලෙස 2024.01.17 දිනැතිව කාර්යාල මැමෝ පත්‍රයක් වැටුප් කළමනාකරණ ශාඛාව වෙත යොමු කර ඇති බව ඉදිරිපත්ව ඇති ලේඛන අනුව නිරීක්ෂණය වේ. එසේම, අංක කෘ.දෙ./පා/1/7/13තාව 111 සහ 2026.05.25 දිනැතිව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ(පාලන) විසින් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති ලිපිය අනුව පැමිණිලිකරුගේ 2023 ජූලි, අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තොම්බර් මාසවලට අදාළව ගෙවූ වැටුප් විස්තර ගණකාධිකාරී, වැටුප් කළමණාකරණ 11 විසින් 2024.01.18 වන දින 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇති බව නිරීක්ෂණය වේ.

කෙසේවෙතත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර සිටින්නේ තමා අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර තමා සේවය කරන මහඉලුප්පල්ලම බීජ පරීක්ෂණාගාරයේ නිර්දේශය සහිතව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැටුප් ශාඛාව වෙත ලිපියක් යොමු කර අදාළ වැටුප් ගෙවූ විස්තර ලබාගත් බවත්, සියලු ලේඛන සමඟ අදාළ අයදුම්පත් භාරදීමට කටයුතු කළ බවත් ය. එහෙත් එකී ලිපියෙහි පිටපතක් පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොමැත. එසේවුවද, එලෙස පැමිණිලිකරු

විසින් ලිපියක් යොමු කර වැටුප් විස්තර ඉල්ලා තිබේ ද යන්න සම්බන්ධයෙන් 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙතින් සිදු කළ විමසීමේ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන) විසින් දැනුම් දී ඇත්තේ, එවැනි ඉල්ලීමක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති බවයි. එසේම, ඒ පිළිබඳව පැමිණිලිකරු සේවය කරන මහඉලුප්පල්ලම බීජ පරීක්ෂණාගාරය වෙතින් සිදු කළ විමසීමේ දී, මහඉලුප්පල්ලම බීජ පරීක්ෂණාගාරයේ ස්ථානභාර නිලධාරී විසින් අංක කෘ.දෙ./එස්.ටී./එම්.අයි.එල්./05 සහ 2026.06.26 දිනැති ලිපිය කොමිෂන් සභාව වෙත යොමු කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු විසින් වැටුප් විස්තර ලබාගැනීම සඳහා එවකට සිටි සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ හරහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැටුප් 11 ශාඛාව වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති බව සහකාර අධ්‍යක්ෂතුමිය විසින් ප්‍රකාශ කරන නමුත්, එකී ලිපියෙහි පිටපතක් කාර්යාලය තුළ තබාගෙන නොමැති බවත්, අදාළ වැටුප් විස්තර අදාළ පුද්ගලයාගේ නමට තැපැල හරහා ලැබෙන අතර, කාර්යාලය වෙත ලැබී නොමැති බවත් ය. මේ අනුව පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර සිටින පරිදි ඔහු විසින් අදාළ වැටුප් විස්තර අග්‍රහාර අයදුම්පත් ඉදිරිපත් කිරීමට පූර්වයෙන් ලබාගෙන ඒවා ද සමඟ අදාළ අයදුම්පත් ඉදිරිපත් කර ඇති බව සනාථ වන ආකාරයේ ලේඛනයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී නොමැති බව පෙනී යයි.

මෙලෙස පැමිණිලිකරු නියමිත කාලය තුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද අයදුම්පත්, 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත නියමිත කාල සීමාව තුළ යොමු කිරීමට නොහැකි වී ඇත්තේ පැමිණිලිකරුගේ දෝෂයක් නිසා නොව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයකින් බවට 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක කෘ.දෙ./පා/6/6/GEN/2024/04 සහ 2024.04.19 දිනැති ලිපිය සහ සමාංක සහ 2024.05.31 දිනැති ලිපිය මගින්, 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත දැනුම් දී තිබුණ ද, 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරීගේ ස්ථාවරයෙහි කිසිදු වෙනසක් සිදු වී නොමැති බවත්, පැමිණිලිකරුගේ අයදුම්පත් නියමිත කාලයේ දී නොලැබීම හේතුවෙන් ප්‍රතික්ෂේප කර ඇති බවත් නිරීක්ෂණය වේ.

තවද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් සේවක සංඛ්‍යාව 9217කට අධික වන බවත්, පැමිණිලිකරුගේ අයදුම්පත් ඉදිරිපත් වූ කාල සීමාව තුළ පැවති ඒකාබද්ධ සේවයේ සේවක හිඟය හේතුවෙන් මෙම සියළු නිලධාරීන්ගේ අග්‍රහාර අයදුම්පත් සම්බන්ධයෙන් එවකට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ සම්බන්ධීකරණ කටයුතු කළේ නිලධාරීන් දෙදෙනෙකු පමණක් බවත්, සිදු වූ ප්‍රමාදයන් සම්බන්ධයෙන් මෙම අයදුම්පත් වලට අදාළව කටයුතු කළ නිලධාරිනිය වෙත මූලික විමර්ශනයක්ද සිදුකර එම නිලධාරිනියට ස්ථාන මාරුවීමක් ද මේ වන විට ලබා දී ඇති බවත් 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක කෘ.දෙ./පා/6/1/20 සහ 2025.07.15 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත යොමු කරමින් සඳහන් කර ඇත.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සලකා බැලීමේ දී පැමිණිලිකරුගේ වැටුපෙන් මාසිකව ජාතික රක්ෂණ භාර අරමුදල වෙත දායක මුදල් අය කරගෙන ඇති බවත්, පැමිණිලිකරු අසනීප තත්ත්වයක් හේතුවෙන් 2023.10.26 සිට 2023.11.13 දින දක්වා අනුරාධපුර ශික්ෂණ රෝහලෙහි ද, නැවත 2023.11.14 දින සිට 2023.12.01 දින දක්වා නෑගම්පහ දිස්ත්‍රික් රෝහලෙහි ද නේවාසිකව ප්‍රතිකාර ලබා ඇති බවත්, එලෙස රෝහල්ගතව ප්‍රතිකාර ලබා ගැනීමට අදාළව අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා වන අයදුම්පත් දෙකක් පැමිණිලිකරු විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බවත්, එකී අයදුම්පත් 2024.01.05 දින කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති බව 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පිළිගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීමට අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(II) හි 07.I. වගන්තිය ප්‍රකාරව අදාළ රක්ෂණ මුදල් ලබාගැනීමට නම් සියලුම අදාළ වෛද්‍ය ශාස්තු හා රෝහල් බිල්පත් ප්‍රතිලාභ ඉල්ලුම්පතට අමුණා දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් දින 90ක් ඇතුළත සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙම ප්‍රතිපාදනය ප්‍රකාරව අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් මගින් පැමිණිලිකරුගේ අයදුම්පත් ඔහු රෝහලෙන් බැහැර වූ දින සිට දින 90ක් තුළ 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත ඉදිරිපත් කර තිබිය යුතු ය. එහෙත් පැමිණිලිකරුගේ පළමු අයදුම්පත පැමිණිලිකරු රෝහලෙන් බැහැර වූ දිනය වන 2023.11.13 දින සිට දින 90ක කාලසීමාව සම්පූර්ණ වන 2024.02.13 දිනයේ සිට දින දෙකකට පසුව 2024.02.15 වන දින ද, පැමිණිලිකරුගේ දෙවන අයදුම්පත පැමිණිලිකරු රෝහලෙන් බැහැර වූ දිනය වන 2023.12.02 දින සිට දින 90ක කාලසීමාව සම්පූර්ණ වන 2024.03.02 දිනයේ සිට දින දෙකකට පසුව 2024.03.04 වන දින ද 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත තැපැල් කර ඇති බව නිරීක්ෂණය වේ. එලෙස ප්‍රමාද වීම මත 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී විසින් පැමිණිලිකරු හට අදාළ අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ලබාදීම ප්‍රතික්ෂේප කර ඇත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 මගින් රාජ්‍ය නිලධාරීන් වෙත ඇති කරනු ලැබූ අග්‍රහාර රක්ෂණ ක්‍රමයෙහි පැමිණිලිකරු සාමාජිකත්වය ලබා ඇති අතර, ඔහු විසින් අදාළ රක්ෂණ වාරික මුදල් සිය වැටුපෙන් ගෙවා ඇත. එවැනි පසුබිමක් තුළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 මගින් දක්වා ඇති අවස්ථාවන් වලදී ප්‍රතිලාභ ලබාගැනීමට පැමිණිලිකරු හට හිමිකමක් ඇති අතර, එම චක්‍රලේඛය ප්‍රකාරව රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබාගන්නේ නම් ඒ සඳහා ප්‍රතිලාභ ලබාගත හැකි බැවින් ඉහතින් සඳහන් කර ඇති පරිදි රෝහල්ගතව නේවාසිකව ප්‍රතිකාර ලබාගත් අවස්ථා දෙකකට අදාළව

අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ප්‍රතිපූරණය කරගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට පැමිණිලිකරු හට නීත්‍යානුකූල හිමිකමක් පවතින බව පෙනී යයි. එකී චක්‍රලේඛයේ 07.I. වගන්තිය ප්‍රකාරව අදාළ රක්ෂණ මුදල් ලබාගැනීමට නම් සියලුම අදාළ වෛද්‍ය ගාස්තු හා රෝහල් බිල්පත් ප්‍රතිලාභ ඉල්ලුම්පතට අමුණා දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් දින 90ක් ඇතුළත සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු බැවින්, පැමිණිලිකරු විසින් පළමු අයදුම්පත රෝහලෙන් බැහැර වූ දිනය වන 2023.11.13 වන දින සිට දින 53ක් සහ දෙවන අයදුම්පත රෝහලෙන් බැහැර වූ දිනය වන 2023.12.02 වන දින සිට දින 34ක් ඇතුළත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සලස්වා ඇති බව තහවුරු වේ.

ඒ ආකාරයට නියමිත කාල සීමාව තුළ අදාළ අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරිපත් කර ඇති බවත්, පැමිණිලිකරු රෝහලෙන් බැහැර වූ දින සිට දින 90ක කාලයක් තුළ පැමිණිලිකරුගේ පළමු අයදුම්පත ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යැවීම සඳහා දින 37ක කාලයක් ද, දෙවන අයදුම්පත ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යැවීම සඳහා දින 56ක කාලයක් ද දෙපාර්තමේන්තු ප්‍රධානියා වන 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හට ඉතිරිව තිබූ බවත්, එකී කාල සීමාව තුළ 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත අදාළ අයදුම්පත් යවා නොමැති බවත් තහවුරු වේ.

කෙසේවෙතත් පැමිණිලිකරුගේ පළමු අයදුම්පත ඉදිරිපත් කිරීමේ දී පූර්වාසන්න මාස තුනක වැටුප් විස්තර ඉදිරිපත් කළ යුතු වුවද පැමිණිලිකරු නියමිත වැටුප් වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් 2023 ජූලි, අගෝස්තු, සැප්තැම්බර් සහ ඔක්තොම්බර් යන මාස වලට අදාළ වැටුප් විස්තර ලබා ගැනීම සඳහා 2024.01.17 දිනැතිව කාර්යාල මැමෝ පත්‍රයක් වැටුප් කළමනාකරණ ශාඛාව වෙත යොමු කර අදාළ වැටුප් වාර්තා ගෙන්වා ගැනීමෙන් අනතුරුව අදාළ අයදුම්පත සහ අදාළ ලේඛන 2 වන වගඋත්තරකරු වෙත යොමු කළ බව 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් සඳහන් කර ඇත. කෙසේවෙතත් පැමිණිලිකරු විසින් අදාළ වැටුප් විස්තර සහිතව තම අයදුම්පත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ බව සඳහන් කළ ද, එය සනාථ කළ හැකි ආකාරයේ සාක්ෂි කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොමැති බව පෙනී යයි.

1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට අධ්‍යක්ෂ (පාලන) විසින් යොමු කර ඇති අංක කෘ.දෙ./පා/1/7/13තාව 111 සහ 2026.05.25 විසින් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති ලිපියෙහි ඇමුණුම් පිළිබඳව සැලකීමේ දී අංක මු/6/3 සහ 2026.05.22 දිනැති ලිපිය මගින් ගණකාධිකාරී, වැටුප් කළමණාකරන 11 විසින් සඳහන් කර ඇත්තේ 2024.01.17 වන දින පාලන 06 ශාඛාව විසින් එවා ඇති මැමෝ පත්‍රය අනුව 2024.01.18 වන දින පැමිණිලිකරුගේ 2023 ජූලි, අගෝස්තු, සැප්තැම්බර් සහ ඔක්තොම්බර් යන මාස වලට අදාළ වැටුප් විස්තර නිකුත් කළ බවයි. ඒ අනුව අදාළ මැමෝ පත්‍රය යොමු කළ දිනට පසුදිනම පැමිණිලිකරුගේ වැටුප් විස්තර වැටුප් කළමණාකරන 2 ශාඛාව මගින් පාලන 06 ශාඛාව වෙත නිකුත් කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව එලෙස පැමිණිලිකරුගේ වැටුප් විස්තර ලැබී ඇති 2024.01.18 වන දින සිට සලකා බැලීමේ දී, 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් හට පැමිණිලිකරුගේ අයදුම්පත් 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත යොමු කිරීම සඳහා පැමිණිලිකරුගේ පළමු අයදුම්පතට අදාළව දින 90ක කාලසීමාව සම්පූර්ණ වන 2024.02.13 දින දක්වා දින 26ක කාලයක් ද, පැමිණිලිකරුගේ දෙවන අයදුම්පතට අදාළව දින 90ක කාලසීමාව සම්පූර්ණ වන 2024.03.02 දින දක්වා දින 43ක කාලයක් ද ඉතිරිව තිබූ බව පෙනී යයි.

එසේහෙයින් 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත අදාළ අයදුම්පත් නියමිත කාලය තුළ ඉදිරිපත් කිරීම 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ වගකීම වන අතර, එය නිසි පරිදි ඉටු නොකිරීම පරිපාලනමය වශයෙන් දෝෂ සහගත වේ. එසේම, අදාළ අයදුම්පත් නියමිත කාල සීමාව තුළ දී 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත ඉදිරිපත් නොවීම පැමිණිලිකරුගේ දෝෂයක් හේතුවෙන් සිදුවූවක් නොවන බවත්, 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් සිය වාර්තාවන් මගින් ද දක්වා ඇති පරිදි පැමිණිලිකරුගේ පාලනයෙන් බැහැර වූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රමාද දෝෂයක් හේතුවෙන් සිදු වූවක් බවත් ඉහත කරුණු අනුව තහවුරු වේ. ඒ අනුව 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 (II)හි 07.I. වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් පැමිණිලිකරු හට අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීමේ හිමිකම අහිමි වී ඇති බව තහවුරු වන බැවින් 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, ඉහතින් සඳහන් කර ඇති පරිදි පැමිණිලිකරුගේ ප්‍රතිලාභ අයදුම්පත් 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත ලැබී ඇත්තේ රෝහලෙන් බැහැර වූ දින සිට දින 90ක කාලසීමාව ඇතුළත නොවන බව තහවුරු වන බැවින්, ප්‍රමාද වී අදාළ අයදුම්පත් ලැබීම හේතුවෙන් 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී විසින් පැමිණිලිකරුට අදාළ අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ලබා දීමට හැකියාවක් නොමැති බවට දැනුම් දීම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 (II) ප්‍රකාරව නීත්‍යානුකූල බව නිරීක්ෂණය වේ. එසේහෙයින් 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී විසින් පවත්නා නීතියට අනුකූලව ක්‍රියා කර ඇති බැවින් මෙම පැමිණිල්ලට අදාළව 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී හට වගකීමක් පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරයි.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර සිටී.**

1. පැමිණිලිකරු 2023.10.26 සිට 2023.11.13 දින දක්වා අනුරාධපුර ශික්ෂණ රෝහලෙහි ද, නැවත 2023.11.14 දින සිට 2023.12.01 දින දක්වා නෑගම්පහ දිස්ත්‍රික් රෝහලෙහි ද නේවාසිකව ප්‍රතිකාර ලබා ගැනීමට අදාළව අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කරගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් දෙක, 2 වන වගඋත්තරකාර ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත යොමු කිරීමට ප්‍රමාද වී ඇත්තේ පැමිණිලිකරුගේ පාලනයෙන් බැහැර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රමාද දෝෂයක් හේතුවෙන් බවට තහවුරු වන බැවින් ද, 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති වාර්තාවන් මගින් ඒ බව පිළිගෙන ඇති බැවින් ද, පැමිණිලිකරු එලෙස රෝහල්ගතව ප්‍රතිකාර ලබා ගැනීමට අදාළ අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභයෙහි වටිනාකම පමිණිලිකරු වෙත ගෙවීමට 1 වන වගඋත්තරකාර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් කටයුතු කළ යුතු ය.

2. අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කරගැනීමට අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(II) හි 07.I. වගන්තිය ප්‍රකාරව අදාළ රක්ෂණ මුදල් ලබාගැනීමට නම් අදාළ සියලුම වෛද්‍ය ගාස්තු හා රෝහල් බිල්පත් ප්‍රතිලාභ ඉල්ලුම්පතට අමුණා දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් දින 90ක් ඇතුළත සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු ය, යනුවෙන් සඳහන්ව ඇත. එහෙත් රක්ෂිතයාගේ පාලනයෙන් බැහැර වූ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ ප්‍රමාද දෝෂයක් හේතුවෙන් අදාළ අයදුම්පත එකී දින 90ක කාලසීමාව ඇතුළත ඉදිරිපත් කිරීමට අපොහොසත්ව ඇති බව තහවුරු වන අවස්ථාවලදී එවැනි අයදුම්පත් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා වගකීමෙන් බැඳෙන බවටත්, රක්ෂිතයාට හිමි රක්ෂණ මුදලෙහි වටිනාකම අදාළ දෙපාර්තමේන්තුව විසින් රක්ෂිතයා වෙත ගෙවිය යුතු බවටත් නව ප්‍රතිපාදනයක් ඇතුළත් කරමින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 සංශෝධනය කිරීම සුදුසු බව පෙනී යයි. ඒ අනුව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඒ පිළිබඳව අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සිදු කළ යුතු ය.

3. රාජ්‍ය ආයතන මගින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත අයදුම්පත් යොමු කිරීමේ දී රක්ෂිතයාගේ හෝ අදාළ ආයතනයේ පාලනයෙන් බැහැර තැපැල් ප්‍රමාදයන් ආදිය සිදු විය හැකි බැවින්, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අදාළ දින 90ක කාලසීමාව ගණනය කිරීමේ දී අදාළ අයදුම්පත ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ලැබුණු දිනය නොව, අදාළ ආයතනය විසින් අයදුම්පත තැපැලට යොමු කර ඇති දිනය, දින 90ක කාලසීමාව ඇතුළත දිනයක් ද යන්න සැලකිය යුතු බවට ද නව ප්‍රතිපාදනයක් ඇතුළත් කරමින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 සංශෝධනය කිරීම සුදුසු බවද පෙනී යයි. ඒ අනුව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ

කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඒ පිළිබඳව අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සිදු කළ යුතු ය.

2026. 08 . 20 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකාර පාර්ශවය සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙහි පළමුවන නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :-

1. අමාත්‍යතුමා,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,කොළඹ 07. - කරුණු දැනගැනීම සඳහා

2. ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,කොළඹ 07 - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා